**<u>මිනිස් බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවට අනුයුක්ත ආශ්‍රිත නිලධාරී සේවා ගණය සඳහා වන වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු ප්‍රතිපත්තිය</u>**

**1. හැඳින්වීම**

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2009.02.20 දිනැති අංක 1589/30 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද කාර්ය පටිපාටික රීති 1 වැනි කාණ්ඩයේ XVIII වැනි පරිච්ඡේදයේ 202 වගන්තියේ විධිවිධාන අනුව මිනිස් බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවට අනුයුක්තව වෘත්තීය මාර්ගෝපදේශ නිලධාරීන් හා ව්‍යාපෘති නිලධාරීන් සහ මානව සම්පත් සංවර්ධන සහකාර හා සංවර්ධන නිලධාරීන් සඳහා වන වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තිය සකස් කරනු ලැබේ.

**2. වාර්ෂික ස්ථාන මාරු සඳහා යටත් වන නිලධරයන් පිළිබඳ විස්තර**

මෙම දෙපාර්තමේන්තුවට අනුයුක්තව සියළුම දිස්ත්‍රික්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල සහ ප්‍රධාන කාර්යාලයේ සේවය කරන පහත සඳහන් තනතුරුවලට අයත් සියළුම නිලධාරීන් සඳහා මෙම අභ්‍යන්තර ස්ථාන මාරු ප්‍රතිපත්තිය අදාල වේ.

i. වෘත්තීය මාර්ගෝපදේශ නිලධාරී / ව්‍යාපෘති නිලධාරී
ii. මානව සම්පත් සංවර්ධන සහකාර / සංවර්ධන නිලධාරී

**2:1 සේවා ස්ථානයක සම්පූර්ණ කළ යුතු සේවා කාලය සහ ස්ථාන මාරු කිරිමේ ක්‍රමවේදය**

2:1:1 තම සේවා ස්ථානයේ අඛණ්ඩව වසර 02 ක් සේවය කරන ලද නිලධරයන් වාර්ෂික ස්ථාන මාරු වීම් සඳහා සුදුසුකම් ලබයි.

2:1:2 එකම සේවා ස්ථානයක් තුළ වසර 05කට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධරයන් ස්ථාන මාරුවීම් වලට යටත් වේ.

2:2:3 දිස්ත්‍රික් ලේකම් / ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල සේවය කරන අතිරික්ත නිලධාරීන් අනිවාර්යෙන්ම ස්ථාන මාරු වීම් වලට යටත් වේ.

2:1:4 දැනට සේවය කරන සේවා ස්ථානයේ වසර 05ක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නිලධරයන් ස්ථාන මාරු අපේක්ෂා නොකරන්නේ නම් එසේ කිරීමට හේතු වු විශේෂිත කරුණු ද සමඟ ඉල්ලුම්පත් භාරගන්නා අවසන් දිනට පෙර අදාළ ස්ථාන මාරු අයදුම්පත මගින්ම දැනුම් දිය යුතුය. (අදාළ වන විශේෂිත කරුණු මෙම ප්‍රතිපත්තියෙහි 5.1, 5.2 හා 5.3 යටතේ දක්වා ඇත.)

2:1:5 ස්ථාන මාරු ඉල්ලුම් කිරීමට යටත් වන නිලධාරීන් ස්ථානමාරු අයදුම්පත් නිසි කලට දෙපාර්තමේන්තුව වෙත නොඑවීමෙන් ඔවුන් රාජකාරී අවශ්‍යතාවය මත ස්ථානමාරු කරනු ලබන අතර ඕනෑම සේවා ස්ථානයක සේවය කිරීමට යටත් වේ.

**2:2 ක්‍රමවේදය හා අනෙකුත් කරුණු**

2:2:1 ස්ථාන මාරු අයදුම් කිරීමට සුදුසුකම් ලබන නිලධරයන් යම් සේවා ස්ථානයකට මාරු වීමට ඉල්ලා ඇති විටදී එම සේවා ස්ථානය සඳහා නිශ්චිත කාර්ය මණ්ඩලය තුළ පුරප්පාඩු නොමැති වන්නේ නම්, එම ඉල්ලීම ඉටු කිරීම සඳහා ඉහත 2.1.2 අවශ්‍යතා සම්පූර්ණ කළ වැඩිම සේවා කාලයක් සහිත නිලධාරයා ඉන් පිටතට ස්ථාන මාරු කරනු ලැබේ.

2:2:2 දිස්ත්‍රික් ලේකම් / ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල සේවය කරන අතිරික්ත නිලධාරීන් අතුරින් වැඩිම සේවා කාලයක් සහිත නිලධාරීන් ඉන් පිටතට මාරු කරනු ලැබේ.

2:2:3 නිලධරයන් ස්ථාන මාරු කිරීමේ දී දෙපාර්තමේන්තුවේ සේවා අවශ්‍යතාවයන් සැලකිල්ලට ගනු ලැබේ.

2:2:4 යම් සේවා ස්ථානයකට ස්ථාන මාරු වීමට වැඩි ඉල්ලීම ප්‍රමාණයක් ඇති විට පහත දැක්වෙන නිර්ණායක මත වඩාත් සුදුසු නිලධරයා තීරණය කරනු ඇත.

I. දෙපාර්තමේන්තුවේ ඉලක්ක සපුරා ගැනීමේ ප්‍රගතිය
II. අයදුම්කරනු ලබන සේවා ස්ථානය පිහිටි දිස්ත්‍රික්කයේ සේවය කර ඇති කාල සීමාව

2:2:5 එකම සේවා ස්ථානයකට නිලධාරීන් වැඩි ගණනක් අයදුම්කර ඇති අවස්ථාවකදී ස්ථාන මාරුවලට අනිවාර්යයෙන් යටත් වන නිලධරයන්ට වැඩි ප්‍රමුඛතාවයක් දෙනු ලැබේ.

**2:3** **සේවා කාලය ගණනය කිරීම**

2:3:1 ස්ථාන මාරුවීම් සඳහා සේවා කාල ගණනය කරනු ලබනුයේ 2018.08.31 දිනටය.

2:3:2 සේවා කාලයන් ගණනය කිරීමේ දී වර්තමාන සේවා ස්ථානයේ සේවයට වාර්තා කල දිනය ආරම්භක දිනය ලෙස සැලකිය යුතුය.

## 03. වාර්ෂික ස්ථාන මාරු කමිටුව

**3:1** අංක 1914/8 හා 2015.05.12 දිනැති ගැසට් පත්‍රයේ පළ වූ රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 200 සංශෝධනයට අනුව ස්ථාන මාරු කමිටුවේ සංයුතිය පහත පරිදි වේ.

I. අධ්‍යක්ෂ (පාලන)
II. දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂවරයෙක්
III. වෘත්තීය සමිති නියෝජිත (ඉහත අංක 2 හි දැක්වෙන සේවාවන්ට අදාල වන තනතුරු දරන නිලධාරීන් අතුරින් 15% ක නියෝජනයක් සහිත සෑම වෘත්තීය සමිතියක් විසින්ම නම් කල නියෝජිතයෙක් )

**3:2** ස්ථාන මාරු කමිටුවක විෂය පථයට පහත සඳහන් අවස්ථා ඇතුලත් නොවේ.

I. විනය නියෝගයක් මත හෝ විනයානුකුල ක්‍රියාමාර්ගයක අවශ්‍යතාව මත හෝ කරනු ලබන ස්ථාන මාරු
II. සේවා අවශ්‍යතාව මත සිදු කරනු ලබන ස්ථාන මාරු
III. නිලධාරීන්ගේ ඉල්ලීම් මත කරනු ලබන ස්ථාන මාරු

## 04. වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුව

I. අධ්‍යක්ෂ ජනරාල්
II. දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ (පාලන) නොවන වෙනත් අධ්‍යක්ෂවරයෙක්
III. සහකාර අධ්‍යක්ෂවරයෙක්
IV. වෘත්තීය සමිති නියෝජිත (ඉහත අංක 2 හි දැක්වෙන සේවාවන්ට අදාල වන තනතුරු දරන නිලධාරීන් අතුරින් 15% ක නියෝජනයක් සහිත සෑම වෘත්තීය සමිතියක් විසින්ම නම් කල නියෝජිතයෙක් )

## 5.1 වාර්ෂික ස්ථාන මාරු ලබාදීමේ දී සැලකිල්ලට ගන්නා පොදු කරුණු

**5:1:1** යම් නිලධරයෙකුගේ කලත්‍රයා පොලිසියේ හෝ ත්‍රිවිධ හමුදාවේ උතුරු නැගෙනහිර ක්‍රියාන්විත රාජකාරියේදී ආබාධිත තත්වයට පත්ව ඇති බවට ලිඛිත සාක්ෂි ඉදිරිපත් කරන විට නිලධරයන්ගේ ස්ථාන මාරුවීම් කළ යුතු වන්නේ ඔවුන්ගේ ඉල්ලීම් අනුව පමණි. එසේම එවැනි නිලධරයන්ගේ ස්ථාන මාරුවීම් ඉල්ලීම් පිළිබඳව ප්‍රමුඛතාවය දැක්විය යුතු වේ.

**5:1:2** සෑම විටම නිලධරයාගේ ඉල්ලීම අනුව තම කලත්‍රයාගේ සේවා ස්ථානය අයත් ප්‍රදේශයට ආසන්න සේවා ස්ථානයකට මාරුවීම් ලබා දීමට හැකි සෑම උත්සාහයක්ම දැරිය යුතුය.

**5:1:3** පාසල් යන දරුවන්, ආබාධිත දරුවන්, දීර්ඝ කාලීන අසනීප මත එක්තැන්ව සිටින කලත්‍රයන් සහ කලත්‍රයා විදේශගතව සිටින අවස්ථාවන්හි වැනි පිළිගත හැකි කරුණු ඇතිව දිස්ත්‍රික් ලේකම්/ ප්‍රාදේශීය ලේකම්/ආයතන ප්‍රධානියාගේ නිර්දේශය සහිතව ඉදිරිපත් කරන ඉල්ලීම පිළිබඳව සළකා බලනු ලැබේ.

## 5.2 වාර්ෂික ස්ථාන මාරුවීම්වලට යටත් නොවන නිලධාරීන්

5.2.1 අවුරුදු 53 ඉක්මවූ නිලධරයන් දිස්ත්‍රික්කය තුළ වෙනත් සේවා ස්ථානයකට මාරු කළ හැකි වුව ද ඔවුන්ගේ ඉල්ලීමක් නොමැතිව දිස්ත්‍රික්කයෙන් පිටතට මාරු නොකළ යුතුය.

5.2.2 2018.12.31. දිනට අවුරුදු 58 ඉක්මවූ නිලධරයන් ඔවුන්ගේ ඉල්ලීමක් නොවන කල්හි දිස්ත්‍රික්කය තුළ වුව ද මාරු නොකල යුතුය.

## 5:3 වෘත්තීය සමිති සඳහා අනුග්‍රහය

5.3.1 කම්කරු කොමසාරිස් විසින් ලියාපදිංචි කරනු ලැබූ වෘත්තීය සංගමයක, සංවිධානයක ලේකම්, සභාපති, භාණ්ඩාගාරික හා මධ්‍ය විධායක සභිකයන් මාරු කරන්නේ නම් අදාළ වෘත්තීය සංගමයේ ලේකම්ගේ නිර්දේශ සැලකිල්ලට ගෙන සංගමයේ කටයුතු වලට බාධා නොවන සේවා ස්ථානයකට මාරු කළ යුතුය.

5.3.2 මෙම වගන්තියේ දැක්වෙන අනුග්‍රහ භුක්ති විඳිමට අපේක්ෂා කරන වෘත්තීය සංගමයේ නිලධරයන් ඒ සඳහා අයදුම්පත්‍රයක් පිළියෙල කර ( ආයතන සංග්‍රහයේ XXV පරිච්ඡේදයේ 7.5 උප වගන්තිය අනුව) ස්ථාන මාරු කමිටු රැස්වීමට සති දෙකකටවත් පෙර මිනිස් බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ආයතන සංග්‍රහයේ XXV පරිච්ඡේදයේ 7:2 උප වගන්තිය අනුව අනුග්‍රහය ලබා දිය යුතු වන්නේ, කවර නිලතල වලටද යන වගත්,ආයතන සංග්‍රහයේ XXV පරිච්ඡේදයේ 7.6 උප වගන්තිය අනුව නිසි බලධරයා විසින් තිරණය කරනු ලැබේ. මේ පිළිබඳව පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

## 5.4 සුහද ස්ථාන මාරුවීම්

5.4.1 2018.08.01 දින සිට 2018.11.15 දිනයන් අතර කාලයේ දී අන්‍යෝන්‍ය ස්ථාන මාරුවීම් සඳහා ඉල්ලීම් භාරගනු නොලැබේ.

5.4.2 නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හෝ එක්ව සුහද ස්ථාන මාරුවීම් සඳහා කරනු ලබන ඉල්ලීම අනුව මාරුවීම් නියෝග කිරීම බලයලත් බලධරයා විසින් කළ යුතුය. සුහද ස්ථාන මාරුවක් ලබාදීමට නිලධාරීයා අවම වශයෙන් 2018.12.31 දිනට වසර දෙකක්වත් (02) සේවා ස්ථානයේ සේවය කර තිබිය යුතුය.

5.4.3 වාර්ෂික ස්ථාන මාරු සමාලෝචන කමිටුවේ තිරණ දැනුම් දෙන දින සිට දින 14 ක් ඇතුලත සුහද මාරු වීම් සඳහා වන ඉල්ලීම් ඉදිරිපත් කල යුතුය.

## 06. ස්ථාන මාරුවීම් කාල සටහන

ස්ථාන මාරු කමිටුව විසින් සිදුකරන වාර්ෂික ස්ථාන මාරුවීම් පහත සඳහන් කාල සටහනට අනුව සිදුවිය යුතුය.

| | |
|---|---|
| අගෝස්තු 04 පෙර | වාර්ෂික ස්ථාන මාරු චක්‍රලේඛය නිකුත් කිරීම |
| අගෝස්තු 31ට පෙර | නිලධාරීන්ගේ ස්ථාන මාරු යෝජනා ඉල්ලුම්පත් ලබාගැනීම සිදුකිරීම |
| සැප්තැම්බර් 22ට පෙර | ස්ථාන මාරු කමිටුව විසින් ස්ථාන මාරු යොජනා අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කිරීම. |
| සැප්තැම්බර් 29ට පෙර | ස්ථාන මාරු තීරණ නිලධාරීන්ට දැනුම් දීම |
| ඔක්තෝම්බර් 13ට පෙර | අභියාචනා ඉදිරිපත් කිරීම |
| නොවැම්බර් 06ට පෙර | සමාලෝචන කමිටු තීරණ අධ්‍යක්ෂ ජනරාල් වෙත දැනුම්දීම |
| නොවැම්බර් 15ට පෙර | නිලධාරීන්ට සමාලෝචන තීරණ දැනුම්දීම |
| නොවැම්බර් 29ට පරෙ | රාජ්‍ය සේවා කොමිෂන් සභාවට අභියාචනා ඉදිරිපත් කිරිම |
| ජනවාරි 01 | වාර්ෂික ස්ථාන මාරු නියෝග ක්‍රියාත්මක විය යුතු දිනය |

## 07. වාර්ෂික ස්ථාන මාරු නියෝගවලට විරුද්ධව අභියාචනා ඉදිරිපත් කිරීම.

7.1 ස්ථාන මාරු කිරීමක් පිළිබඳව දෙන ලද නියෝගයකට එරෙහිව කිසියම් රජයේ නිලධරයෙකු විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කරන්නේ නම්, එම අභියාචනය රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහයෙහි අංක 23 පරිශිෂ්ඨයට ප්‍රකාරව පමණක් ඉදිරිපත් කල යුතු වන්නේය. තවද තමන් විසින් ඉදිරිපත් කරනු ලබන කරුණු තහවුරු කිරීමට අදාල ලියවිලි වල සහතික කල පිටපතක් එම අභියාචනය සමග ඉදිරිපත් කිරීමටද, ඔහු ක්‍රියා කල යුතු වන්නේය.

7.2 රජයේ නිලධරයෙකු විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කළ යුතු වන්නේ, ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් මගින් වන අතර, එම අභියාචනයේ පිටපතක් අදාළ පරිදි දෙපාර්තමේන්තු ප්‍රධාන හා ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත ද යොමු කළ යුතු වන්නේය. තමන් වෙත ඉදිරිපත් වන අභියාචනා අප්‍රමාදවම තම නිරීක්ෂණ සහිතව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කිරීම ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ වගකීම වන්නේය. නිලධරයාට තම කැමැත්ත පරිදි, අභියාචනයේ ප්‍රගමන පිටපතක් සෘජුවම රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ හැක්කේය.

7.3 ස්ථාන මාරු කිරීමේ නියෝගයට එරෙහිව ඉදිරිපත් කරනු ලබන අභියාචනයක්, එම ස්ථාන මාරු කිරීමේ නියෝගය අදාළ රජයේ නිලධාරියා වෙත ද ලද දින සිට දින සිට දින 14ක් ඇතුළත ඉදිරිපත් කළ යුතු වන්නේය. නියමිත කාලය තුළදී ඉදිරිපත් නොවන අභියාචනා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ප්‍රතික්ෂේප කරනු ලබන්නේය.

7.4 කොමිෂන් සභාව වෙත යොමු කිරීම සඳහා නිලධරයෙකු විසින් භාර දෙනු ලබන අභියාචනය අදාල සියලු ලිපිගොණු, ලිපි ලේඛන හා වාර්තා ආදියද, ඊට අදාළ තම නිරීක්ෂණ ද, නිර්දේශද සහිතව එම අභියාචනය ලැබී දින 15ක් ඇතුළත රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ඉදිරිපත් කිරීමට අදාල දෙපාර්තමේන්තු ප්‍රධාන හා ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වග බලා ගත යුතු වන්නේය. එතකුදු වුවත් රජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහයෙහි XVIII වැනි පරිච්ඡේදයේ සඳහන් වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධ අභියාචනා අදාළ ලිපිගොනු, ලිපි ලේඛන, වාර්තා, නිරීක්ෂණ හා නිර්දේශ සමග එම වර්ෂයේ නොවැම්බර් 15 වැනි දිනට ප්‍රථම රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කල යුතු වන්නේය.

7.5 මෙම පරිච්ඡේදයෙහි සඳහන් නියමයන්ට අනුගතව තම අභියාචනය ඉදිරිපත්කිරීම සෑම රජයේ නිලධාරයෙකුගේම වගකීම වන අතර, ඊට පටහැනිව ඉදිරිපත් කරනු ලබන අභියාචනා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සළකා බලනු නොලබන්නේ ය.

7.6 ඉහත 7.4 වගන්තියේ සඳහන් ලියවිලි ලැබී දින 15ක් ඇතුළත, ස්ථාන මාරු කිරීමේ නියෝගයකට එරෙහිව රජයේ නිලධරයෙකු විසින් ඉදිරිපත් කර ඇති අභියාචනා සම්බන්ධයෙන් තීරණයක් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගනු ඇත්තේය.

7.7 ඉහත සඳහන් පරිදි ඉදිරිපත් කර ඇති අභියාචනයක් සම්බන්ධයෙන් වන රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය සෘජුවම අභියාචක වෙත දක්වනු ලබන අතර, අදාළ ලිපිගොනු යථාවත් කර ගැනීම සඳහා එහි පිටපත් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත හා දෙපාර්තමේන්තු ප්‍රධාන වෙත යවනු ලබන්නේය.

7.8 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගයකින් හෝ තීරණයකින් හෝ අතෘප්තියට පත්වන රජයේ නිලධරයෙකුට 2002 අංක 04 දරණ පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරිය පනතේ සඳහන් විධිවිධාන වලට අනුකූලව පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරිය වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට හිමිකම ඇත්තේය. එසේ වුව ද ඒ සඳහා පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරියේ අවසන් තිරණයක් ලැබෙන තෙක් අදාළ ස්ථාන මාරු නියෝගය එලෙසම ක්‍රියාත්මක විය යුතු වන්නේය.

නීල් බණ්ඩාර හපුහින්න
අධ්‍යක්ෂ ජනරාල්
මිනිස්බල හා රැකිරක්ෂා දෙපාර්තමේන්තුව

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| අධ්‍යක්ෂ ජනරාල්<br>பணிப்பாளர் நாயகம்<br>Director General | 0113094117 | කාර්යාලය<br>அலுவலகம்<br>Office | 011 2187131 | ෆැක්ස්<br>தொலைநகல்<br>Fax | 011 2187133 | විද්‍යුත් තැපැල<br>மின்னஞ்சல<br>e-mail | dgdme@sltnet.lk<br>dmenpes@sltnet.lk |


මිනිස්බල සහ රැකීරක්ෂා දෙපාර්තමේන්තුව

மனித வலு வேலைவாய்ப்புத் திணைக்களம்
DEPARTMENT OF MANPOWER AND EMPLOYMENT


9 වන මහල | 9th Floor | 9ம் மாடி
සෙත්සිරිපාය 2 වන අදියර | Sethsiripaya 2nd Stage | செத்சிரிபாய 2ம் கட்டம்
බත්තරමුල්ල | Battaramulla | பத்தரமுல்லை


D

මගේ අංකය / எனது இல / My No } DoME/01/11/14
ඔබේ අංකය / உமது இல / Your No }
දිනය / திகதி / Date } 2015.07.

අධ්‍යක්ෂ - මිනිස්බල සැලසුම් සංවර්ධන හා පර්යේෂණ

අධ්‍යක්ෂ - පාලන

අධ්‍යක්ෂ - රැකියා නිර්මාණ ප්‍රවර්ධන හා වෘත්තීය මාර්ගෝපදේශ

ප්‍රධාන ගණකාධිකාරී

සහකාර අධ්‍යක්ෂ - සැලසුම් හා ප්‍රගති මෙහෙයුම්

සහකාර අධ්‍යක්ෂ - මහජන රැකියා සේවා අංශය

**<u>වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු - 2016</u>**

මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවට අනුයුක්තව ඔබ අංශයේ සේවය කරනු ලබන පහත තනතුරු වලට අයත් නිලධාරීන් සඳහා 2016 වාර්ෂික ස්ථාන මාරු චක්‍රලේඛය මේ සමඟ ඔබ වෙත එවමි.

I. වෘත්තීය මාර්ගෝපදේශ නිලධාරී
II. ව්‍යාපෘති නිලධාරී
III. මානව සම්පත් සංවර්ධන සහකාර
IV. සංවර්ධන නිලධාරී

02. මෙම චක්‍රලේඛය සම්බන්ධයෙන් ඉහත නිලධාරීන් දැනුවත් කර ස්ථාන මාරු අයදුම් කිරීමට සුදුසුකම් සම්පූර්ණ කර ඇති නිලධාරීන්ගේ ස්ථාන මාරු අයදුම්පත් ඔබගේ නිර්දේශය ද සහිතව 2015.09.18 දින හෝ ඊට පෙර ලැබෙන සේ පාලන අංශය වෙත ඉදිරිපත් කරන ලෙස කාරුණිකව ඉල්ලමි.

එච්.ජී.ජී.ජේ.ධර්මසේන
අධ්‍යක්ෂ ජනරාල්
මිනිස්බල හා රැකිරක්ෂා දෙපාර්තමේන්තුව.

දුරකථන /தொலைபேசி / Telphones
:

අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் நாயகம் / Director General — 0113094117
කාර්යාලය / அலுவலகம் / Office — 011 2187131
ෆැක්ස් / தொலைநகல் / Fax — 011 2187133
විද්‍යුත් තැපැල / மின்னஞ்சல / e-mail — dgdme@sltnet.lk, dmenpes@sltnet.lk

# මිනිස්බල සහ රැකීරක්ෂා දෙපාර්තමේන්තුව
# மனித வலு வேலைவாய்ப்புத் திணைக்களம்
# DEPARTMENT OF MANPOWER AND EMPLOYMENT

| | | |
|---|---|---|
| 9 වන මහල | 9th Floor | 9ம் மாடி |
| සෙත්සිරිපාය 2 වන අදියර | Sethsiripaya 2nd Stage | செத்சிரிபாய 2ம் கட்டம் |
| බත්තරමුල්ල | Battaramulla | பத்தரமுல்லை |

D

මගේ අංකය / எனது இல / My No — **DoME/01/11/14**

ඔබේ අංකය / உமது இல / Your No —

දිනය / திகதி / Date — **2015.07.**

දිස්ත්‍රික් / ප්‍රාදේශිය ලේකම්,

දිස්ත්‍රික් / ප්‍රාදේශිය ලේකම් කාර්යාලය

........................................

## <u>වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු - 2016</u>

මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවට අනුයුක්තව දිස්ත්‍රික් හා ප්‍රාදේශිය ලේකම් කාර්යාවල සේවය කරනු ලබන පහත තනතුරු වලට අයත් නිලධාරීන් සඳහා 2016 වාර්ෂික ස්ථාන මාරු චක්‍රලේඛය මේ සමඟ ඔබ වෙත එවමි.

I. වෘත්තීය මාර්ගෝපදේශ නිලධාරී
II. ව්‍යාපෘති නිලධාරී
III. මානව සම්පත් සංවර්ධන සහකාර
IV. සංවර්ධන නිලධාරී

02. මෙම චක්‍රලේඛය සම්බන්ධයෙන් ඉහත නිලධාරීන් දැනුවත් කර ස්ථාන මාරු අයදුම් කිරීමට සුදුසුකම් සම්පූර්ණ කර ඇති නිලධාරීන්ගේ ස්ථාන මාරු අයදුම්පත් ඔබගේ නිර්දේශය ද සහිතව 2015.09.18 දින හෝ ඊට පෙර ලැබෙන සේ මෙම දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලෙස කාරුණිව ඉල්ලමි.

එච්.ජී.ජී.ජේ.ධර්මසේන

අධ්‍යක්ෂ ජනරාල්

මිනිස්බල හා රැකිරක්ෂා දෙපාර්තමේන්තුව.


දුරකථන /தொலைபேசி / Telphones
:

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| අධ්‍යක්ෂ ජනරාල් <br> பணிப்பாளர் நாயகம் <br> Director General | 0113094117 | කාර්යාලය <br> அலுவலகம் <br> Office | 011 2187131 | ෆැක්ස් <br> தொலைநகல் <br> Fax | 011 2187133 | විද්‍යුත් තැපෑල <br> மின்னஞ்சல <br> e-mail | dgdme@sltnet.lk <br> dmenpes@sltnet.lk |